සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා

**සති පාසල 11**

## බෞද්ධ පූජා කර්ම - III

## දොරකඩ අස්න

මෙහි කතාව වන්නේ සති පිරිත අවසානයේ පිරිත් ඇසීමට දෙවිවරුන්ට ආරධනා කිරීමය. ඉතාමත් ගෞරවාන්විත ව තල් ගොබයක පත් ඉරුවල දේව ආරාධනා ලියා එය සරසනු ලැබූ ලීයක දෙපස රඳවයි. දේව දූතයකු සේ සැරසුන පිරිමි ළමයෙකු පෙරහැරකින් තල්පත් රැගෙන දේවාල වෙත යයි. දේවාලයේ සතර කොන දේව ආරධනා පත් එල්ලූ පසුව පෙරහැර නැවත විහාරය වෙත පැමිණේ.

දේව දූතයා කඩුගත් රැකවලුන් මුර කරන කාමරයක රඳවා තබයි. රාත්‍රී පිරිතට වඩින භික්ෂූන් සමඟ දේව දූතයා පෙරහැරින් පිරිත් මණ්ඩපය වෙත එයි.

දොරටුව ළඟ සිටින දේව දූතයා සහ භික්ෂුක හා සංවාදයේ යෙදේ.(විචිත්‍රවත් සංස්කෘත පද බහුල මිශ්‍ර සිංහල බසින් මෙම සංවාදය ඉදිරිපත් කෙරේ)

භික්ෂුවගේ ප්‍රශ්න විචාරීමට අනුව දේව දූතයා දොරකඩ හස්න ශබ්ද නගා කියවයි. දොරකඩ හස්න කියවූ පසු අනුශාසනා ඉදිරිපත් කෙරේ.

### මෙහි නාට්‍යමය අවස්ථා

- අනුකරණය - දේව දූතයෙකු ලෙස හැසිරීම.
- සමාරෝපය - දේව දූතයෙකු ලෙස වෙස් ගැනීම.
- සංවාද භාවිතය - දේව දූතයා හා භික්ෂුව අතර සංවාදය.

- නාට්‍යමය උපකරණ භාවිතය - තල් පත කත් ලීයක එල්ලීම.
- ප්‍රේක්ෂකයෝ- පිරිත් ඇසීමට ආ පිරිස
- අංග රචනය - දේව දූතයෙකු ලෙස ඇඳුම් පැළඳුම්වලින් සැරසීම.
- ආලෝකය භාවිතය - පන්දම් එළි භාවිතය
- වේදිකාව - පිරත් මණ්ඩපය

වැනි අවස්ථා සේම ප්‍රාසාංගික ලක්ෂණ ද දැකිය හැකි ය.

<u>පැවරුම</u>

1. **මෙම පූජා කර්මය පවත්වන්නේ කුමක් අවසානයේද?**
2. **මෙම බෞද්ධ පූජා කර්මය කෙටියෙන් විස්තර කරන්න.**
3. **මෙහි ඇතුළත් නාට්‍යමය අවස්ථා උදාහරණ සහිතව ලියා දක්වන්න.**